# ජීවිත ගංගාවේ



එම්.ඩී.දෙසදි දෙව්හාරා

I

කෘතියේ නම : ජීවිත ගංගාවේ

කතෘගේ නම : එම්.ඩී.දෙසදි දෙව්හාරා

දිනය : 2024.11.28

ISBN NO : 978 – 624 – 208 – 704 - 7

# පිදුම

කෙතරම් දුක් කරදර බාධක අපවෙත පැමිණියත්

ඒවා මගහරිමින් තම ජීවිතය

සාර්ථක කරගැනීමට වෙරදරන

සියලුම සිසු සිසුවියන්ට

...පිදන පිදුමයි මේ...

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ,දඹදෙණි යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි.දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම එයට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ ලක්ෂණයකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රටතුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වාදෙන්නට විය.මෙම ශාස්ත්‍රීය හා ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මාහට අභිමානයක් වන අතර ම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි.ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක්වනු නොඅනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

ඉතින් හැමදාම වගේ අදත් මගේ තාත්තා ගෙදර එනකොට රාත්‍රී 8.00ටත් කිට්ටුයි.ඒ එනකොටත් එන්නේ වෙරිමරගාතේ වැටීගෙන.කුලී වැඩ කරලා හම්බෙන තුට්ටු දෙකෙනුත් තාත්තා කරන්නෙම බොන එක.අදත් ඉතින් ගෙදර ඇවිත් ගෙදර පිළිකන්නට වෙලා ඉන්නවා වෙරි බහිනකන්. ඊටපස්සේ ටිකක් වෙලා ඉඳලා අම්මට කියනවා,

'සීලෝ බත් එක ගෙනෙන්.'

කියලා.මගේ අම්මත් තාත්තා කිවුව ගමන් බත් එක බෙදනවා කුප්පි ලාම්පු එළියෙන්.අම්මා ඒ කරලා වතුර කෝප්පෙකුත් එක්ක තාත්තට බත් එක ගිහින් දෙනවා.අම්මා බත් එක ගිහින් දුන්නට පස්සේ තාත්තා පිළිකන්නේ ඉඳලම බත් එක කනවා.ඒ කරලා තාත්තට බත් එක ගිහින් දුන්නට පස්සේ තමයි අම්මා මටයි අම්මටයි බත් එක බෙදාගෙන මටත් කවලා අම්මත් කන්නේ.අපි කන අතරතුර තමයි තාත්තා නාගන්න පහළ ළිඳට යන්නේ.හැමදාම වගේ වෙන්නේ මේ ටිකම තමා. ඒ කරලා තාත්තා ඇවිත් නිදාගන්නවා.

දවසක් මමයි අම්මයි තාත්තා එන්න කලින්ම කෑම කන්න ගත්තා. මොකද රෑ 10.00යටත් කිට්ටුයි තත්තා ඒ වෙනකොටත් ගෙදර ඇවිත් හිටියෙ නැති නිසා. අම්මා බත් පිගානක් බෙදාගෙන මට බත් කටක් කැවුවා.ඊටපස්සේ අම්මා බත් කට කන්න යනකොටම තාත්තා ඇවිත් බත් පිගාන විසික් කෙරුවා.

'නෙල්සන් ඔයා මොකක්ද ඒ කෙරුවේ?'

අම්මා ඒක ඇහුවේ තරහකින් නෙමේ කලකිරීමකින්.

'හ්.. මං නැතුව තොපිලා බත් කන්න? ඒවා ඉතින් හඳේ තමයි.දැන් ඉතින් නැගිටපු එකේ මට බත් එකක් බෙදලා ගනින්කෝ හොඳ එකී වගේ'

කියලා තාත්තා මාව ඉඳගෙන හිටපු පුටුවෙන් ඇදලා දාලා තාත්තා ඒ පුටුවෙන් ඉඳගත්තා.

මගේ අම්මා හරිම නිහතමානී මනුස්සයෙක්.මගේ අම්මයි තාත්තයි මමයි ජීවත් වෙන්නේ මහනුවර පැණිදෙණියේ.මගේ අම්මාගේ ගම කන්තලේ, හැබැයි තාත්තගේ ගම මහනුවර නිසා අපි දැන් ජීවත් වෙන්නෙ මහනුවර.

ඉතින් මං කියන්න ගියේ මගේ අම්මා හරිම නිහතමානී මනුස්සයෙක්.තාත්තා මාව පුටුවෙන් ඇදලා දැම්මට පස්සේ මම කරේ කාමරේට ගිහින් පාඩම් කරපු එක.මොකද මට ඕන වුනේ කවදාම හරි දවසක මගේ අම්මවයි තාත්තවයි දුකක් නොදී හොඳට බලාගන්න.මං පාඩම් කරේ කුප්පි ලාම්පු එළියෙන්.

ඒ දවස් වල මං 7 වසරේ විතර ඇති.මං ඉගෙන ගත්තේ මගේ අම්මා රෙදි මහන්න ගිහින් දවසකට හම්බකරන රු.150න්.මගේ තාත්තා වුනත් බිවුවට මගෙයි අම්මගෙයි ඕනෑ එපාකම් හොයලා බලනවා.මගේ තාත්තා කරෙත් කුලී වැඩ නිසා අපේ පුංචි පවුල දුප්පත් පවුලක්.ඒක නිසාම තමයි මං පුලුවන් තරම් මහන්සි වෙලා ඉගෙනගන්නේ මගේ අම්මවයි තාත්තාවයි සතුටින් තියන්න.

ඉතින් මං එදා කුප්පි ලාම්පු එළියෙන් පාඩම් කර කර ඉන්නකොට අම්මා ඇවිත් මගේ ඔලුව අතගාලා ඇහුවා,

'අනේ, මගේ රත්තරන්ට බඩගිනියි ද? බලන්නකෝ පුතේ තාත්තා මේ කරන වැඩ නිසා අද මයෙ අම්මට කන්නත් නෑනේ.බඩගිනියි නම් කියන්න පුතේ බත් නම් නෑ මං කහට ඩිංගක් වත් කරලා දෙන්නම්'

'නෑ අම්මේ මට බඩගිනි නෑ.අම්මා ඇදට නිදාගන්න යනකොට අම්මා මට කතා කරන්නකෝ'

කියලා.අම්මා මගේ ඔලුව අතගාලා අම්මා ගියා.ටිකක් වෙලා ගියාට පස්සේ අම්මා මං පාඩම් කරන කාමරේට ඇවිත් කිවුවා,

'අදට ඔය ඇති පුතේ, එන්න යමු මං නිදාගන්න යන්නේ දැන්.'

කියලා.මම අම්මා ඇවිත් එන්න කිවුවට පස්සේ ගියා අම්මත් එක්ක ඇදට නිදාගන්න.මමයි අම්මයි නිදා ගන්නේ එක ඇඳේ.තාත්තා නිදාගන්නේ වෙනම ඇඳක.මං හැමදාම නිදාගන්නකොට අම්මට තුරුල් වෙලා තමයි නිදා ගන්නේ.මොකද අම්මා ළඟින් එන සුවඳට මං පුදුම තරම් කැමතියි.මම අම්මාගේ තුරුලට ගිහින් ඇහුවා,

'අම්මේ, තාත්තා අද බීලා ඇවිත් බත් එක විසික් කරපු වෙලාවේ ඇයි අම්මා තාත්තට මොකුත් කිවුවේ නැත්තේ?'

එතකොට අම්මා හිනා වෙලා දුන්නේ මෙහෙම උත්තරයක්.

'පුතේ,මිනිස්සු එකිනෙකට වෙනස්.ඉතින් ඔයාගේ තාත්තයි මමයි කියන්නේ සම්පූර්ණයෙන්ම එකිනෙකට වෙනස් මිනිස්සු දෙන්නෙක්.නොගැළපෙන තැන් ගොඩක් තිබුනත් ඒ තැන් අපි ගළපගන්න ඕනේ. ඉතින් පුතේ ඔයාගේ තාත්තා අද ඇවිත් කරපු වැඩේට මං ඔයාලගේ තාත්තට කෑහැහුවා නම් අද අපි දෙන්නට නිදාගන්න වෙන්නේ ඇඳේ නෙමේ පිළිකන්නේ.'

කියලා අම්මා මගේ ඔලුව අතගෑවා. අතගාලා අම්මා අයෙම කිවුවා,

'පුතේ හම ප්‍රශ්නෙකටම තියෙන හොඳම උත්තරේ තමයි නිහඬව ඉන්න එක.හරි දැන් මගෙ පුතා නිදාගන්නකෝ. දැන් ගොඩක් රෑ වෙලානේ.'

කියලා අම්මා ඇස් පියාගෙන නිදාගත්තා. මාත් මගේ අම්මා මොනවගේ ගතිගුණ තියෙන කෙනෙක්ද කියලා හිතලා හිතලා අන්තිමට නිදා ගත්තා.

ඉතින් ඔහොම ටික ටික කාලේ ගෙවිලා ගිහින් මටත් නොදැනිම මං 11 වසරටත් ඇවිත්. මගෙයි අම්මාගෙයි හයියට හිටපු මහා රුක්ෂ ගහ, ඒ කියන්නේ මගේ තාත්තා. මං 10 වසරෙදි මාවයි අම්මාවයි තනි කරලා මේ ලෝකෙන් යන්නම ගියා.ඊට පස්සේ කුලියක් කරලා හරි අපිව ජීවත් කරවන්න කවුරුත් නැති නිසා මගේ අම්මා මාව ජීවත් කරවලා මට උගන්නනන්න නොවිදපු දුකක් මේ වෙනකොට නැති තරම්.මං ඉස්කෝලේ යන්න ඕනේ නිසා අම්මා උදෙන්ම නැගිටලා කෑම උයලා ඊට අමතරව කඩයප්පන් හදනවා කඩයට දාන්න.මං හැමදාම ඉස්කෝලේ යන ගමන් උදේට කඩයප්පන් ටික කඩයට දාගෙන යනවා. මං ඉස්කෝලේ ගියාට පස්සේ අම්මා රෙදි මහන තැනට යනවා.

ඉතින් ඒ කාලෙත් ටික ටික ඔහොම ගෙවිලා ගිහින් අන්තිමට මගේ සාමාන්‍ය පෙළ විභාගයත් ළං වුනා.දැන් මේ වෙනකොට විභාගයට හරියටම තියෙන්නේ සති දෙකයි.මං රැයක් දවාලක් බලන්නේ නැතිව මහන්සි වෙන්නේ මගේ අම්මාව කවදාහරි දවසක් රැජිනක් වගේ බලාගන්න.

ඉතින් අද විභාගයේ ඇඩ්මිශන් දුන්නා.මං ඒක අම්මට පෙන්නුවාම අම්මා කිවුවා,

‘පුතේ, ඔයා ඔයාට දෙයක් කරකන්න.කාටවත් අතපාලා ජීවත් නොවෙන තරමට ඔයා ඔයාගේ ජීවිතය හදා ගන්න. මම අද ඉදලා හෙට මැරිලා යන්න පුලුවන්.ඒත් මං මැරුනටත් පස්සේ ඔයාට ජීවත් වෙන්න තව ගොඩක් කල් තියෙනවා.ඉතින් ඔයා පුරුදු වෙන්න ඕන නියම පිරිමියෙක් වගේ මේ මහ පොළොවේ පය ගහලා ජීවත් වෙන්න.’

එහෙම කියලා අම්මා මගේ නළට හාදුවක් දුන්නා.

‘මං පොරොන්දු වෙනවා අම්මේ,මං අම්මට පොරොන්දු වෙනවා.’

මං කිවුවට පස්සේ අම්මා කිවුවා,

‘ඔයාට කවදාවත් වරදින්නේ නෑ මගෙ පුතේ.’

මේ සති දෙකත් හරි ඉක්මනට ගෙවිලා ගියේ කෝච්චියක් යන වේගෙන්.මම මේ සති දෙකේ රැයක් දවාලක් බලන්නේ නැතුව පුදුම මහන්සියකින් පාඩම් කරා.

ඉතින් අද තමයි ඒ දවස. මම අද උදෙන්ම නැගිටලා පහළ ළිදට ගිහින් මුහුණකට සෝදගෙන ඇවිත් යුනිෆෝර්ම් එක ඇදගෙන අම්මා කඩලා තිබ්බ වතුසුදු මල් වට්ටිය අරගෙන බුදුහාමුදුරුවන්ට මල් පූජා කරලා,පහන තියලා, බුදුන් වැන්දා.

මං බුදුන් වැඳලා ගෙදරින් එළියට ආවා.ඒ එනකොට අම්මා වතුර වීදුරුවකට වතුසුදු මල් දාගෙන මං ඉස්සරහට ආවා.ඒ කරලා අම්මා මට කිවුවා,

'මේක බොන්න පුතේ.'

මට ඒක බොන ගමනුත් මගේ හිතට ආවේ මගේ තාත්තව.මට මතක් වුනා,'අනේ අද මගේ තාත්තා හිටියනම් මං එයාගේ කකුල් දෙක අල්ලලා වැන්දට පස්සේ මට කියයි,

'විභාගය හොදට ලියලා වරෙන් පුතේ.'

කියලා.මගේ තාත්තා කියන්නේ කොයි වගේ තරාතිරමක හිටියත් , මොන දේ කරත් මං එදා ඉඳලා ආදරේ කරපු මගේ ලෝකේ වීරයාට.මං මගේ තාත්තට මගේ අම්මට තරමටම ආදරෙයි.ඒ වගේම මං මේ ලෝකෙ පුදුම විදියට ගරු කරපු, තාමත් ඒ විදිහටම ගෞරව කරන මනුස්සයෙක්.මට හිතුනා මගේ තාත්තා එදාවගේම අදත් කොහේ හරි ඉඳලා මං දිහා බලාගෙන ඇති කියලා.

'ඉක්මනට වතුර එක බොන්නකෝ පුතේ'

කියලා අම්මා මට කිවුවට පස්සේ තමයි මම හරි සිහියට ඇවිත් තියෙන්නේ.මං ඊට පස්සේ ඒ වතුර වීදුරුවෙන් උගුරු දෙක තුනක් බිවුවා.ඒ කරලා මං අම්මට දණ ගහලා වැන්දා.වැඳලා නගිටිනකොට අම්මා මගේ නළලට හාද්දක් දුන්නා.

'අනේ පුතේ මං නම් දන්නේ නෑ ඔයා ඔය රැයක් දවාලක් බලන්නේ නැතිව මොනවද ඔච්චරටම පාඩම් කරේ කියන්න.කොහොමහරි ඒත් මං දන්නවා ඔයා ඔය විභාගය ඉහළින්ම සමත් වෙනවා කියන්න.'

කාගේ ආශිර්වාදය නැතත් මගේ අම්මාගේ ආශිර්වාදය මට මහමෙරක් තරම් වටිනවා.මං ඊට පස්සෙ ඉස්කෝලෙට ආවා එතකොට මගේ යලුවොත් ඇවිත් හිටියා.මං ඒ ගොල්ලොන්ට විභාගය හොදට ලියන්න කියලා සුභ පතපු වෙලේ එයාලත් මට සුභ පැතුවා.මං ඊට පස්සේ මං විභාගය ලියන්න ඉන්න ශාලාවට ඇවිත් ටික වෙලාවක් යනකොට අපේ පේපර්ස් බෙදන්න ගත්තා.මං හොද හුස්මක් අරගෙන පේපර්ස් වල උත්තර ලිවුවා.

ඊට සති දෙකකට විතර පස්සේ සාමාන්‍ය පෙළ විභාගයත් ඉවර උනා.

මං විභාගය ඉවර වෙලා දවස් දෙකකට තුනකට විතර පස්සේ කඩයක වැඩට ගියා.මොකද අවුරුදු 16ක් විතර වෙනකන් මගේ අතපය හතර හොදට හැදුවටත් පස්සේ මගේ අම්මාට මං තව වදයක් වෙන්න ඕනේ නැති නිසා. මං අම්මට කිවුවත් 'අම්මා දැන් ගෙදරට වෙලා විවේක ගන්න' කියලා.

අම්මට බැරිලු එකපාරම කර කර හිටපු රස්සාව නතර කරන්න. මාත් තාම ඉස්කෝලේ යන නිසා අම්මට ගෙදර ඉන්නත් කම්මැලියිලු.ඒක නිසා අම්මා තාමත් රෙදි මහන තැන වැඩට යනවා.ඒ අතරේ තවමත් අම්මා කඩයප්පන්,වැලිතලප වගේ දේවල් උදේ හවස කඩේට දානවා.

ඔහොම ගිහින් ටික කාලෙකට පස්සේ ඉස්කෝලෙට අපේ සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල ඇවිත් තිබුනා.ඒ කරලා උදෑසන රැස්වීමක් අරගෙන අපේ විභාග ප්‍රතිඵල කිවුවා.එතකොට නම් මගේ පපුව එකසිය ගානට ගැහෙන ගමන් තිබුනේ.ඒක මටම දැනුනා

ටික වෙලාවකට පස්සේ

'රුවන් කුමාර D - 9 යයි'

කියලා කියනකොට මට මගේ ඇස් අදහාගන්න බැරි වුනා.මං ස්ටේජ් එකට ගිහින් විදුහල්පතිතුමාට වැඳලා මගේ රිසාල්ට් ශීට් එක ගත්තා.එතකොට විදුහල්පතිතුමා මගේ පිටට තට්ටුවක් දාලා '**GOOD LUCK**'කියලා කිවුවා.මම සර්ටත් හිනා වෙලා ස්ටේජ් එකෙන් බැහලා ආවා.

අපිට ඊට පස්සේ පන්තිවලට යන්න කිවුවා.ඒ ගියාට පස්සේ මගේ යලුවෝ ඔක්කොම වගේ හොද රිසාල්ට් එකක් දාලා තිබුනා.මං ඒ කට්ටියට සුභ පැතුවට පස්සේ එයාලත් මට සුභ පැතුවා.

එදා මම ගෙදර ගියේ පුදුම සතුටකින්.මොකද කියනවා නම් මගේ අම්මා තියා මමවත් මේ වගේ රිසාල්ට් එකක් බලාපොරොත්තු වුනේ නෑ.මං ගෙදර ගියාට පස්සේ හිතුවා අම්මව පුදුම කරන්න ඕනේ කියලා.

මං ගෙදර යනකොටත් අම්මා හිටියේ පහළ ළිද ළග රෙදි සෝදන ගමන්.මං අම්මා ළගට ගිහින් මගේ රිසාල්ට් ශීට් එක දාලා තියෙන ඇන්ලොප් එක අම්මට දීලා කිවුවා,

'අම්මේ,ඔයාට ලියුමක් ඇවිත් කියලා'

මං හොරේ අහුවෙන්නේ නැති වෙන්න හිනාව කාගෙන හිටියා.ඊට පස්සේ අම්මා මං දිහා බලලා මගේ රිසාල්ට් ශීට් එක අරගත්තා.අම්මා ඒ කරලා මං දිහා බැලුවා.ඒ වෙනකොටත් මගේ අම්මාගේ ඇස් කඳුලු පටලෙකින් තෙත් වෙලයි තිබ්බේ. ඒ කරලා අම්මා අත්දෙක එකතු කරලාකිවුවා,

'අනේ දෙවියනේ,මගේ කොල්ලට කවදාවත් වරදින්න එපා කියලා.'

ඊට පස්සේ අම්මාගේ ඇස් වහගෙන හිටපු කඳුලු පටලේ කැඩිලා අම්මාගේ කම්මුල් දිගේ කදුලු කැට පල්ලම් බැස්සා.

ඉතින් මට වැඩි වෙලාවක් ගියේ නෑ, ඒ විදිහට අම්මාගේ කම්මුල් දිගේ පල්ලම් බැස්සේ සතුටු කඳුලු කියලා තේරුම් ගන්න.අම්මා එහෙම කියලා මාව බදාගත්තා. ඒ කරලා අම්මා මට කිවුවා,

'ඔයා ඔයාගෙ ගමන යන්න පුතේ,ඔයාගේ අම්මා හැමදේකටම ඔයත් එක්ක ඉන්නවා.ඒක නිසා ඔයා කිසිම දේකට බය වෙන්න එපා.'

ඉතින් මං ළිඳ ළඟදිම අම්මට දණගහලා වැඳලා ආවා මොකද මට වැඩට යන්න තියෙන නිසා.මං ඒ කරලා ළිඳ ළඟට නාගන්න යනකොට අම්මා ගෙදරට ඇවිත් හිටියා.මං නාගෙන ආව ගමන්ම අම්මා මට බත් කැවුවා.ඊට පස්සේ මං වැඩට ගියා.

ඊළඟ දවසට එළිවුනා.ඒත් මං අද නම් ඉස්කෝලේ ගියේ නෑ.මොකද ඊයේ මං වැඩ කරන තැන ටිකක් වැඩ වැඩි දවසක්.මං ඊයේ ගෙදර එන්න ගොඩක් රෑ වුනත් එක්කන්.මං එනකොටත් අම්මා කන්නෙත් නැතුව මං එනකන් බලාගෙන ඉන්නවා.මං ඊට පස්සේ අම්මත් එක්කම කාලා නිදාගත්තා.

ඉතින් මගේ අම්මා අද උදෙන්ම නැගිටලා කිරිබතුත් හදලා මගේ රිසාල්ට් එකේ සතුට සමරන්න.තාත්තා අම්මවයි මාවයි මේ ලෝකේ තනිකරලා යන්නම ගියපු දවසේ ඉඳලා මගේ අම්මා මාව සතුටු කරන්න නොකරපු දෙයක් නෑ.

ඉතින් මාව සතුටු කරන්න අම්මා මේ කරන දේවල් මට මහමෙරක් තරම් වටිනවා.ඊට පස්සේ අම්මා කැට කපපු කිරිබත් කැටයක් අරන් ඇවිත් මට කැවුවා. කවලා අම්මා මට කිවුවා,

'පුතේ මං ඔයාගේ තාත්තා නැති වුනු දවසේ ඉඳන් ඔයාව මෙච්චර කරදඩු උස්මහත් කරන්න කාපු කට්ට ගැන මට කිසිම දුකක් නෑ.අද ඔයාගේ තාත්තා හිටිය නම් අද මට වඩා සතුටු වෙන්නේ එයා පුතේ.'

එහෙම කියලා අම්මා අනිත් අතින් කඳුලු පිහිදගත්තා.

'පුතේ ලෑස්ති වෙන්නකෝ දළදා හාමුදුරුවොන්ව වැඳලා ආශිර්වාද ගන්න යන්න.මේ වගේ සතුටු හිතෙන දවසකම තමයි අපි ගිහින් උන්වහන්සේගෙන් ආශිර්වාද ලබා ගන්න ඕනේ.'

මං ඊට පස්සේ සුදු ඇඳුමක් ඇඳගත්තා.අම්මත් ලස්සන සුදු ගවුමක් ඇඳගෙන ආවා දළදාව වදින්න යන්න.ඊට පස්සේ අපි එතනට ගිහින් ගත්තු රතුපාට ඕලු මල් හරිම පිං පාටයි.හරියට මගේ ලස්සන අම්මාගේ රතුපාට කම්මුල් වගේ.ඒවට වතුර ඉස්සට පස්සේ මාරම ලස්සනයි.මමයි අම්මයි දළදා වහන්සේ වැඳලා රෑ වෙන්න කලින් ගෙදර ආවා මොකද මට හෙට ඉස්කෝලේ යන්න ඕනේ නිසා.

පහුවදා මං ඉස්කෝලේ ගියා.එදා අපිට **A/L** වලට විශයන් තෝර ගන්න තිබ්බා.ඉතින් මං තෝරගත්තේ ජීව විද්‍යාව ඒකට අනුව අපි පන්තිවලට වෙන් කරා.මං ජීව විද්‍යා විශය තෝරගන්න ලොකුම හේතුව වුනේ,මගේ තාත්තා.එයා ඒ කාලේ ඉඳලම පුදුම ආශාවකින් හිටියේ කවදාහරි දවසක මාව **Doctor** කෙනෙක් කරන්න.ඒකාලේ ඉඳලම තාත්තා මට කිය කිය හිටියේ,

'කවදාහරි දවසක දොස්තර මහත්තයෙක් වෙලා මටයි අම්මාටයි නොමිලේ බෙහෙත් දෙන්න,මගේ ආර්ථිකය මේ දවස්වල කඩන් වැටිලා තියෙන්නේ'

කියලා.ඒ කියනකොටත් හිනා වෙවී කියන්නේ.අම්මත් දැනගෙන හිටියා මං කොහොමත් තෝර ගන්නේ ජීව විද්‍යාව විශය කියලා.කෝකටත් කියලා මං අම්මට කිවුවා මං තෝරගත්තේ ජීව විද්‍යාව විශය කියලා.අම්මා කිවුවා,

'පුතේ,මේ අහන්න මං ඔයාට අනික් දරුවන්ගේ අම්මලා වගේ, පුතේ මේක කරන්න,පුතේ අරක කරන්න කියලා කියන්නේ නෑ.ඔයාට හොඳයි කියලා හිතෙන දේ ඔයා කරන්න.මොකද විභාග ශාලාවට ගිහින් විභාගය ලියන්නේ ඔයා මිසක් මම නෙමෙයිනේ.'

කියලා අම්මා කිවුවා.මගේ අම්මා ගැන මට ගොඩක් සතුටුයි.මොකද එයා කවදාවත්ම එයාගේ පැත්තෙන් විතරක් ප්‍රශ්න දිහා බලලා තීරණ ගන්න මනුස්සයෙක් නෙමේ.මං මගේ අම්මාගේ ආසම ගතිගුණය ඒක.

ඉතින් මං තෝරගත්තේ ජීව විද්‍යාව නිසා මාව වැටුනේ 12 **D [Sci]** පන්තියට.මාත් එක්ක හිටපු යාලුවෝ ඔක්කොම වගේ කරේ වෙනත් විශයන්. ඒ නිසා මම විතරයි ජීව විද්‍යාව කරන්නෙ මගේ යාලුවොන්ගෙන්.අපේ අම්මානම් කියලා තියෙන්නෙ 'යාලුවෝ ආශ්‍රය කරන්න ඔනේ අතේ දුරින් කියලා.'මොකද අපේ තාත්තා වුනත් ගොඩක් බොන්න පුරුදු වෙලා තියෙන්නේ යාලුවොත් එක්ක ඉඳලමයි කියලා අම්මා කියනවා.ඒත් අම්මා ඒකෙන් අදහස් කරන්නේ නෑ යාලුවෝ කියලා ජාතියක් ජීවිතේට ඕනේ නෑ කියලා.අම්මා කියන්නේ එයාලට උදවුවක් ඕනේ වුනොත් ඒ ගැන දෙපාරක් හිතන්නේ බලන්නේ නැතිව උදවු කරන්න කියලා.හැම යාලුවෙක්ම නරක නෑ.යාලුවොන්ගෙන් ගන්න ඕන හොඳ ආදර්ශ විතරක් අරගන්න ඕනේ කියලා තමයි අම්මානම් කියන්නේ.

ඉතින් විශයන් තෝරගත්තටත් පස්සේ මං එදාට දෙන සටහන එදාටම පාඩම් කරා මොකද ඔක්කෝම ගොඩ ගහගෙන පාඩම් කරන්න හිටියා නම් මට පාඩම් කරන්න වෙන්නේ නෑ.අනික ජීව විද්‍යාව කියන විශය තෝරගත්තට කරන්න මාර විදිහට කට්ටක් කන්න ඕනේ.

ටික ටික කාලේ ගෙවිලා ගිහින් අන්තිමට මගේ **A/L** විභාගයත් ළං වුනා.මං ඉතින් **O/L** වලට වඩා **A/L** වලට මහන්සි වුනා.

O/L වලට වගේම උදේට ඉස්කෝලෙට විභාගය ලියන්න යනකොට මගේ අම්මා වතුසුදු මල් වට්ටියක් කඩලා තිබ්බා. මම ඒ මල් වට්ටියත් බුදුහාමුදුරුවොන්ට පූජා කරලා එළියට එනකොට අම්මා වතුර වීදුරුවකට වතුසුදු මල් දාලා ගියපාර වගේම මගේ ඉස්සරහට ආවා.මම ඒක බිවුවා.ඒ කරලා අම්මා මට කිවුවා,

'ගිය පාර වගේම හොඳට විභාගය ලියලා එන්න පුතේ.මගේ ආශිර්වාදේ හැමදාම ඔයාට තියෙනවා.'

කියලා අම්මා මගේ නළලට හාද්දක් දුන්නා.මං අම්මට වැඳලා විභාගය ලියන්න ඉස්කෝලෙට ආවා.ඒ එන අතරමදිත් මට මතක් වුනේ මගේ තාත්තව.එයා මගෙයි අම්මාගෙයි ළඟ ඉන්න ඕනම කාලේ අපි දෙන්නව දාලා ගිය එක ගැන මං අදටත් පසුතැවෙනවා.මගේ ජයග්‍රහණයන් දැකලා සතුටු වෙන්න ඕන කාලේ ඉතින් එයා මාව දාලා ගියා.මං තාත්තගේ හීනේ හැබෑ කරන්න අද තියෙන පේපර් එකටත් හොඳට ලියලා ආවා.

මෙහෙම ටික දවසක් යනකොට මෙච්චරකල් පෙරුම් පුරලා පුරලා ලිවුව A/L විභාගයත් ඉවර වුනා.ඉතින් මං අපේ ඉස්කෝලෙ අභිමානවත් උප ප්‍රධාන ශිෂ්‍ය නායකයා නිසා A/L ඉවර වුනත් මට ඉස්කෝලෙ යන්න වුනා.

ඉතින් කොහොම හරි අපේ බැජ් පළන්දන දවසත් ළං වුනා.එදා මගේ අම්මා ඇඳගෙන ඇවිත් හිටියේ ලස්සන රෝසපාට සාරියක්.ඒ සාරියත් එක්ක මගේ අම්මා හරිම හුරුබුහුටි විදිහට මට පෙනුනා.මගේ හොඳම යාලුවාගේ අම්මත් එක්ක තමයි අම්මා ඉස්කෝලෙ මොකක් හරි දේකට ආවහම වැඩිපුරම ඉන්නේ.ඉතින් එදත් අම්මා අසලි නැන්දත් එක්ක හිටියා උඩ තට්ටුවේ.අපි හිටියේ පහළ.කොහොම හරි බැජ් පැළැන්දුවට පස්සේ මං අම්මා ළඟට ගියා.මං එතකොට තමයි දැක්කේ මගේ අම්මාගේ ඇස්වල කඳුලු පිරිලා තියෙනවා.මං අම්මා ළඟටම යනකොට, අම්මා ඒ කඳුලු ඇහිපිල්ලම් ගහලා වෙළගන්න හැදුවත් අම්මාට ඒක කරගන්න බැරි වුනා.අම්මාගේ ලස්සන ඇස්වලින් ආපු කඳුලු බිංදු අම්මාගේ කම්මුල් දිගේ පල්ලම් බැස්සා.මං ඊට පස්සේ අම්මාව බදාගත්තා.ඒ කරලා අම්මා කිවුවා,

'මගේ පුතාට රත්නත්තරේ පිහිටයි.'

කියලා.බැජ් පළන්දපු උත්සවයට පස්සේ ඉස්කෝලේ එක එක උත්සව ගොඩක් තිබුනා.විශේෂයෙන්ම අවුරුදු උත්සවය වගේ දේවල් ගොඩක් තිබුනා.ඉතින් අපිට මේ කාලේ තියෙන්නේ විනෝදයෙන් ඉන්න.එහෙමයි කියලා ගොඩක්ම සතුටු වෙන්නත් හොඳ නෑ. මොකද A/L වල ප්‍රතිඵල එනවනේ. අනේ මන්දා මට මොන වගේ රිසාල්ට් එකක් එයිද කියන්න.පුලුවන් උපරිමේටම මම මහන්සි වෙලා විභාගයනම් ලිවුවා හැබැයි.

මීට සති දෙකක විතර ඉදලා මගේ අම්මාගේ උරහිස් කැක්කුම,පපුව මැද්ද රිදෙනවා වගේ පොඩි පොඩි රෝගී ලක්ෂණ වගයක් තියෙනවා.මේ Heart Attack වල පෙර ලක්ෂණ කියලාමයි මට හිතුනේ. මං අපේ අම්මටත් කිව්වා අම්මේ ඔය Heart attack වල පෙර ලක්ෂණ කියලා.ඒත් අම්මා නම් ඕවා කනකට ගත්තේ නෑ.මං දැන් ගොඩක් දවසක ඉදන් අම්මා ළගට වෙලා නෙමේ නිදා ගන්නේ.කලින් අම්මයි මමයි දෙන්නම නිදියපු ඇදේ දැන් අම්මා විතරයි නිදා ගන්නේ.මං අම්මාගේ ඇද ළගම බිම නිදාගන්නේ.ඉතින් ඔහොම නිදාගන්න ගිය දවසක මං අම්මට කිව්වා,

'අම්මේ,දැන් ඔයාට මොකද.කැක්කුම් අඩුයිද?'

'හ්ම්ම්...දැන් නම් වෙනදා තරම් කැක්කුමක් නෑ.පොඩ්ඩක් විතර පපුව මැද්ද රිදෙන ගතිය තියෙනවා.'

'තාමත් රිදෙනවද අම්මේ.'

මට අම්මා ගැන ගොඩක් දුක හිතුනා.

'වෙලාවකට රිදෙනවා.වෙලාවකට නෑ.'

මං මේක කියනවද නැද්ද කියලා හිතලා හිතලා අම්මට අන්තිමට මේ ගැන කිව්වා.

'අම්මේ මේ අහන්නකෝ,මං මේක කිව්වට අම්මා කලබල වෙන්න එපා.මං අහලා තියෙන විදිහට ඔහොම උරහිස් කැක්කුම්,පපුවේ මැද ගැස්ට්‍රයිටිස්ට් වලට වගේ රිදෙන්නේ නම් ඔය Heart attack වල පෙර ලක්ෂණ.ඒ හින්දා අම්මේ මාත් එක්ක හෙට බෙහෙත් ටිකක් ගන්න යමුද?'

මං අම්මාගේ ඔලුව අතගාලම අම්මට කිව්වා.

'අනේ පුතේ,ඔයා ඔය දුක් මහන්සියෙන් හම්බකරලා ඉතුරු කරගත්ත සල්ලිවලින් මගේ මේ ලෙඩේට බෙහෙත් ගත්තම ඉතිරියක් වෙන්නේ නෑනේ.අනික මට මොන Heart attackද පුතේ.මේ මගේ ඉස්සර ඉදන්ම තිබ්බ ගැස්ටික් වැඩි වෙලානේ.'

'හා අම්මේ,ඔයත් මං කියන දේ අහන්නේ නෑනේ.කමක් නෑ.මොකක් හරි අමාරුවක් වුනොත් මට රෑ මැද කියලා බලන්නේ නැතිව කතා කරන්නකෝ.බුදු සරණයි අම්මේ.'

අම්මා කොහොම කිව්වත් මගේ හිතට නම් බයක් දැනෙනවා අම්මට මේ තියෙන ලෙඩේ ගැන මතක් කරද්දිත්.

ඔහොමම සතියක් දෙකක් ගෙවිලා ගියාට පස්සේ එක දවසක් උදේ මං නැගිටිනකොටත් අම්මා නැගිටලා හිටියේ නෑ. වෙනදට නම් අම්මා මං නැගිටින්න කලින් නැගිටිනවා.එදා නම් අම්මා නැගිටලා හිටියේ නෑ.මං හිතුවා අම්මා තවම නිදි ඇති කියලා.පැය දෙකක් තුනක් විතර ගියාට පස්සේ මං බැලුවා අම්මා ඇයි තවමත් නගිටලා නැත්තේ කියලා.

ඒ වෙනකොටත් අවුරුදු 18ක් තිස්සේ විදින්න ඕන දුක් කන්දරාව අඩුවක් නැතුව විදලා, මටත් කියන්නේම නැතුව මගේ රත්තරං අම්මා නින්දෙන්ම මාව දාලා ගිහිල්ලා.අනේ දෙවියනේ ඇයි මගේ අම්මාව මෙච්චර ඉක්මනට මගෙන් උදුරලා ගත්තේ.දැන් මගේ රත්තරං අම්මයි තාත්තයි දෙන්නම මං ගාව නෑ.දැන් කොහේහරි යනකොට,

'මගේ රත්තරංට බුදුසරණයි.පරිස්සමට ගිහිල්ලා එන්න'

කියලා හාද්දක් දෙන්නා හිටපු එකම මනුස්සයා මගේ අම්මා විතරයි.ඉතින් මේක තමයි ජීවිතේ හැටි කියලා මළගමට ආපු අය මගේ ඔලුව අතගාලා යනකොට තමයි මට හිතුනේ 'ප්‍රශ්නය තමන්ගේ නොවනකත් පිළිතුර දාර්ශනිකයි'කියන කියමන ඇත්තක් කියලා.මගේ අම්මාගෙ මළගම කරේ මගේ අම්මාගේ පැත්තේ නෑදැයින්.ගොඩක්ම මහන්සිවුනේ මගේ පුංචි අම්මා. අම්මාගේ මළ ගෙදර වැඩ ඉවර වුනාට පස්සේ මගේ පුංචි අම්මා සති තුන හතරක්ම මාත් එක්ක හිටියා.

මගේ අම්මා මාව දාලා ගිහිල්ලා ටික දවසකට පස්සේ මගෙ A/Lවල රිසාල්ට් ඇවිත් තිබුනා ඉස්කෝලෙට. බලනකොට මගේ රිසාල්ට් එක D – 1,B – 2යි. අනේ මේ රිසාල්ට් එක බලනකොටම මට මතක් වුනේ මගේ අම්මාව.මොකද මේ ගැන දැන ගත්තා නම් මටත් වඩා සතුටු වෙන්නේ මගේ අම්මා.මං හිතුවෙම අම්මායි තාත්තයි දෙන්නම කොහේහරි ඉදන් මං දිහා බලාගෙන ඉන්නවා ඇති කියලා.මං හැමදාම බුදුන් වැදලා මගේ නැතිවුනු අම්මටයි තාත්තාටයි දෙන්නටම නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.මොකද මං ළග නැති ඒ දෙන්නා වෙනුවෙන් මට කරන්න පුලුවන් එකම දේ ඒ දෙන්නට හොද ආත්මෙකට යන්න පිං දෙන එක විතරයි.

එදා මං එදා ගිහින් බුදුන් වැදලා අම්මටයි තාත්තටයි මගේ ප්‍රතිඵලය කිවුවා.මට ගොඩක්ම මතක් වුනේ මගේ අම්මාව.එදා වගේම අම්මාව පුදුම කරන්න රිසාල්ට් ශීට් එකක් දෙන්න තියෙනවා නම් කියලා මට හිතුනා.මගේ අම්මා නැති වුනේ මම හිතුවා වගේම **Heart attack** එකක් නිසාම තමයි.එයා මාව දාලා ගිය එක ගැන මට පුදුම දුකක් තියෙන්නේ,මොකද මං හරි හමන් රස්සාවක් කරන කාලෙකදි මං මගේ අම්මාව හොදට බලාගන්න හිටිය එක මට කරගන්න බැරි වුනානේ කියන එක මගේ හිතේ තදින්ම තියෙනවා.මගේ අම්මා නිදහසේ නින්දෙන්ම හුස්ම පොද අතාරින්නත් හුගක් පිං කරලා තියෙනවා කියන්න මට වෙලාවකදි හිතෙනවා.

මගේ රිසාල්ට් එකට මට ආවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය.මාත් ඒ විශ්වවිද්‍යාලෙට යන්න තමයි ගොඩක් ආශාවෙන් හිටියේ.මගේ අම්මාගෙයි,තාත්තගෙයි,මගෙයි සතුට රැඳිලා තිබ්බ ඒ ගෙදර මම ගොඩක් අමාරුවෙන් වුනත් හිත හදාගෙන විකුණුවා. ඒ සල්ලි වලින් තමයි මම නැවතිලා ඉන්න තැනට සල්ලි ගෙවුවේ.ඊට අමතරව මම කලින් වැඩ කරපු කඩේ වැඩටත් යනවා.

මං තේරුනේ විශ්වවිද්‍යාලේ **Medical faculty** එකට.එහෙට ගිහින් අවුරුදු දෙකකට පස්සේ **Hospital** යන්න වුනා අපේ **Trainings** වලට. **Hospital** එකේ ලෙඩ්ඩුන්ගේ **Sick history mark** කරන්න වගේ පොඩි පොඩි වැඩ වගයක් තිබ්බා අපිට එතන කරන්න.

ඉතින් නොදැනිම කාලේ ගෙවිලා ගිහින් අවුරුදු 4කට පස්සේ මගේ **Graduation Ceremony** එකත් තිබුණා.ඉතින් ඒකට ආවේ, මගේ අම්මා මාව දාලා මේ ලෝකෙන් යන්නම ගියපු දවසේ ඉඳලා මාත් එක්ක මගේ පිටිපස්සෙන් හැමදේකටම හිටපු මගේ පුංචි අම්මා. එයත් මගේ අම්මා වගේමයි.හැමදේකටම ළමයින්ට පන්නන්නේ නෑ.ඕන උදවුවක් කිවුවොත් පුංචි අම්මා මොන දේ හරි කරල ඒ උදවුව කරලා දෙනවා.ඉතින් එයා එදා මගේ **Graduation ceremony** එකට ඇවිත් කියපු දෙයක් මට තාම මතකයි.

'පුතේ,මං දන්නේ නෑ ඇයි ඔයාගේ අම්මට මේ වගේ ලෙඩක් හැදිල අපිව මෙච්චර ඉක්මනට දාලා ගියේ කියන්න.මං කැමති නෑ අද වගේ ලස්සන දවසක පරණ මතක අවුස්සන්න.ඒත් පුතේ මට අද ඔයාගේ ඔය ලස්සනම ලස්සන මූණ බලන්නත් මොකක්ද වගේ.මොකද අක්කා හිටියනම් අද එයා මේ ලෝකේ කවදාවත් සතුටු නොවුනු තරමට සතුටු වෙයි.ඉතින් මගේ අක්කා කොහේහරි ඉඳන් ඔයා දිහා බලාගෙන ඔයාට ආශිර්වාද කරනවා ඇති පුතේ.ජීවිතේට ආපු හැලහැප්පිලි මැද්දේ ඔයා ඔයාගේ ජීවිතේ හොයාගෙන ඉවරයි.මතක තියා ගන්න පුතේ,ගගක් වුනත් ලස්සන වෙන්න ඉදල හිටලා ගලක් දෙකක් තියෙන්නම ඕනේ.ඒ වගේම තමයි ඔයාගේ ජීවිතේට ආපු ප්‍රශ්න.මං කියන්නේ නෑ මෙතනින් එහාට තවදුරටත් ඔයාගේ ජීවිතේට ප්‍රශ්න එන්නේ නෑ කියලා.ප්‍රශ්න එයි ඒත් ඔයා ඒවට හොදට මුහණ දෙනවා කියන්න මං දන්නවා.ඉතින් මම දැන් කියන්න බය නෑ මගේ අක්කාගේ එකම පුතා දැන් මේ මහපොළොවේ පය ගහලා ඉන්න පුලුවන් නියම දොස්තර මහත්තයෙක් කියලා.'

කොච්චර හිත හයිය කරගෙන ඉන්න හැදුවත් පුංචි අම්මගෙ ඒ වචන වලට මගේ ඇස්වලට කඳුලු ඉනුවා.මගේ අම්මත් මොකක්හරි දෙයක් කියන්න ගියොත් ආයේ ඇඩෙන්නම කියනවා.ඉතින් පුංචි අම්මත් ඒ වගේ.ඉතින් පුංචි අම්මා කියපු දේවල් වලින් මට තේරුණා පුංචි අම්මා ඒ වචන ටික කිවුවේ හද පතුලෙන්මයි කියලා.

ඉතින් මමත් හැමෝටම කියන්න කැමතියි,

'ගගක් වුනත් ඔහේ ගලාගෙන යනකොට ලස්සන නෑ.ඉදලා හිටලා ගලක් දෙකක් තියෙන්නම ඕනේ. සමහර තැන්වල මහා ගල් පර්වත වුනත් තියෙන්න පුලුවන්.එතකොට තමයි ගගක් වුනත් ලස්සන වෙන්නේ.ඒ ඔක්කොම මග හැරලා ගිහින් අන්තිමට හැමෝගෙම ආකර්ෂණය දිනාගන්න පුලුවන් ලස්සනම ලස්සන දියඇල්ලක් වෙන්නෙත් ඒ හැලහැප්පිලි මැද්දේ ගලාගෙන ආපු ඒ ගගමයි.

ඒ වගේම තමයි අපේ ජීවිතෙත්.ඕන තරම් ප්‍රශ්න,අමාරු කාල ජීවිතේට එන්න පුලුවන්.අපි හැමෝම පුරුදු වෙන්න ඕන, ඒ තැන් දරාගෙන ජීවිතේ ඉස්සරහටම යන්න.ඒ යන අතරමගත් පොඩි පොඩි ප්‍රශ්න,දුක් කරදර ඇති වෙන්නෙ නැතිවම නෙමෙයි.

ඉතින් ඒකාලේ මිනිස්සු කියලා තියෙනවා,

'මැණිකක් වුනත් වටිනාකමින් වැඩි වෙන්නේ ඔප මට්ටම් වෙන්න වෙන්න'

කියලා.ඉතින් අපිත් අපේ ජීවිතය මිල කළ නොහැකි මැණිකක් බවට පත් කරගමු.

සමාප්තයි !

# පසුවදන

රටේ අනාගට සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යයේ ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධි පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක කළේ පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප,පළාත්,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වන්සේලා ද සම්බන්ධ කරගැනීම විශේෂත්වයකි.මෙහිදී මහාමාය බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය,දියණියන්,ගුරුභවතුන්,දෙමාපියන් හා ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවෙකින්වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනාර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතුවී ඇති බව පර්යේශනාත්මකව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි.තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයින් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ.තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාණ සම්බන්ධීකාරක,

සෙනවිරත්න මහලේකම්